ශ්‍රී වජ්‍රඥාන සාහිත්‍යය
හෙවත්
පැළෑණේ සිරි විදුරනැණ පබඳ

අංක 1

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1 වැනි පරිච්ඡේදය

ධර්ම ශාස්ත්‍රීය ලිපි

බුදුරජාණන් වහන්සේ

බුදුරජාණන් වහන්සේ නම්: බෞද්ධයන්ගේ ශාස්තෘන් වහන්සේය - හෙවත් - උන් වහන්සේ අදහන පිරිසගේ අනුශාසකයන් වහන්සේ ය.

උන් වහන්සේ තමන් වහන්සේට ඇහුම්කම් දෙන පිරිසට මෙලොවැ සදාචාරයෙන් හා යහපත් දියුණුවෙන් ද - පරලොවැ සුගතියෙන් ද - කෙළවර සියලු ම සසරදුක් ගෙවා සියලු ලෝකයන් ඉක්මවා ලැබියැ යුතු පරම මොක්ෂ (= ඉතා ම උසස් නිදහස) නම් වූ පරමශාන්තිසංඛ්‍යාත නිවන් සැපතින්ද අනුශාසනා කරන (= උවදෙස් දෙන) තුන් ලෝ වැස්සනට එකම ගුරුවූ මාර්ගදේශකයන්වන සේක.

වෙන සමයයන්හි ඉෂ්ට දේවතාවන් මෙන් ලොවත් ලෝවැස්සනුත් මවන වවන වනසන දුකින් හෝ ගලවන දුකෙහි හෝ අලවන දඬුවම් හෝ සත්ප්‍රසාද දෙන බලි හෝ බිලිපුද ගන්නා ශාප හෝ කෝප කරන තමන් කෙරෙහි භක්තිමාත්‍රය ම උසස් යැයි දක්වන සර්වබලධාරී අදෘශ්‍යමාන වූ පරිකල්පිත වූ (=සමහරුන් විසින් සැකැයෙන් 'ඇතැ'යි වරදවා සිතා ගන්නා ලද) අප්‍රත්‍යක්ෂ වූ (කිසිවකුට ත් ඇස්හමු නොවූ) එහෙයින් ම කවදා වත් කවුරුන් විසින් වත් නුදුටුවිරූ වූ ආකස්මික වූ හෙවත් කාරණයක් හේතුවක් නැති වැ ස්වභාවයෙන් ම (=ඉබේ ම) ඇති වූ අක්‍රමසිං වූ - හෙවත් - ක්‍රමයෙන් උසස් බවට පැමිණි පිළිවෙළක් නැති වැ අක් මුල් නැති හැම කල්හි එකසේ උසස් වැ සිටියා වූ හැම තැනැ ම ඇතැයි සිතතත් කිසි තැනෙක දී ත් නොපෙනුණුදෙවි **කෙනෙක්** නො වෙති. දේවත්වය ද ඉක්මැ ගිය ආශ්චර්යය මනුෂ්‍යෝත්තමයාණ කෙනෙකි.

උන් වහන්සේ නො ගිණියැ හැකි තරම් දික් කලකට පෙර අප වැනි ගුණ නුවණ ඇති මිනිස් කෙනෙක් වැ සසර දුක් විඳුනා සතුන් කෙරෙහි දයායෙන් ඔවුන් එයින් මුදන්නට පොහොසත් වනු පිණිස දානාදී ගුණ දහම් පුරමින් පව්කම් අත් හරිමින් ජාතියක් පාසා ක්‍රමයෙන් ගුණයෙන් හා නුවණින් දියුණු වෙමින් අවුත් කෙළවරදී හැම නුගුණයෙන් මිදුණු හැම සුගුණයෙන් පිරුණු හුදු පින්පිඩක් වූ ආශ්චර්යය මනුෂ්‍යයකු බවට පැමිණ මධ්‍යම ප්‍රතිපදායෙන් වීර්යය වඩා නුවණ ඉතා ම දියුණු කැර ගෙන ඒ ස්වකීය ඥානයෙන් සත්ත්වයාගේ භවයෙන් භවයට පෙරෙළෙමින් දුක් විඳිමින් **පැවැත්ම ත්** එසේ වන්නට **හේතු ත්** එ දෙකින් තොර වූ **සැනැසීම ත්** එය ලැබීමට ස්වකීය සන්තානයෙහි පුහුණු කට යුතු වූ මධ්‍යම ප්‍රතිපදා නම් වූ **'උතුම් මඟත්'** අනුන්ගේ උවදෙසක් නැති වැ ප්‍රත්‍යක්ෂ කොට දැනැ වදාළ සේක. මෙසේ සත්වයා පිළිබඳ **සැබෑ තතු සතර** නම් වූ චතුරාර්යසත්‍යය ස්වයම්භූඥානයෙන් අවබොධ කොටැ හැම පව් හැම කෙලෙස්

නසා හැම උතුම් ගුණනුවණින් සම්පූර්ණ වැ වෙන සත්නට ත් මේ සත්‍යය අවබොධ කරවන්නට සමර්ථ වූ හෙයින් ''සම්‍යක්සම්බුද්ධ'' නම් වූ සේක.

ඒ සම්මාසම්බුදුන් වහන්සේ සකල සත්වයන් වෙතැ කරුණායෙන් පැරුම් පිරීමට පටන් ගෙනැ ක්‍රමයෙන් තියුණු වූ ප්‍රඥායෙන් කෙළවරදී සියලු සැබෑතතු අවබොධ කැරැ ගත්තාක් මෙන් ම බුදු වූ පසුත් හැම සත්නට කරුණායෙන් තුන්ලොවැ සැරි සරා අපමණ දුක් ගෙනැ ප්‍රඥායෙන් ඒ ඒ සත්වයන්ගේ ආශානුශයචරිතාදියට සරි ලන සැටි බලා ධර්මදේශනා කොටැ **උද්ඝාටිතඥාදි** බොහෝ සත්නට (සූවිසි අසංඛ්‍යයක් පමණ සත්වයන්හට) චතුස්සත්‍යාවබොධය කැරැවූ සේක. **පදපරම** වූ අනන්ත සත්වයනට ත් අනාගතයෙහි චතුස්සත්‍යාවබොධයට මඟ යෙදූ සේක. නොයෙක් සත්නට මෙලොවැ මැ ලෞකික සම්පත් හා පර ලොවැ සුගතිසම්පතු ත් ලබන මඟ හුදු කුළුණින් නොමිළයේ කියා දුන් සේක.

මෙසේ මහකුලුණැති මහනුවණැති ඒ තුන් ලෝහිමියාණන් වහන්සේ පරමකොටිප්‍රාප්ත වූ ශීලයෙන් ද සමාධියෙන් ද ඍද්ධිවිධාදි අභිඥායෙන් ද - සියලු දෑ සිතූ කෙණෙහි බැලියැ හැකි ආවර්ජනප්‍රතිබද්ධ වූ නුවණැසින් ද - සිතා නො නිමියැ හැකි - රූපවිලාස වචනවිලාසාදී අනන්තගුණයෙන්ද යුක්ත වූ සේක.

උන් වහන්සේ ලොවැ පහළ වැ යටැ කී නොකී අනන්තගුණයෙන් යුක්ත වැ මුළු තුන්ලොවට ලොවී ලොවුතුරා වැඩසාදමින් පන්සාළිස් වසක් මුළුල්ලේ මහඟු මෙහෙයක් කළ බවට වර්තමාන පුරාණවස්තුවිද්‍යාඥයන් සොයා හෙළි කළ දෑ ද තත්කාලීන වූ ත් තදාසන්නකාලයෙහි වූ ත් පඬුවන් පත්පොත්හි ලියූ දෑ ද **ප්‍රත්‍යක්ෂ**සාක්ෂ්‍යයෝවෙති. උන් වහන්සේ පිරිනිවියත් වදාළ දහම් එක එක කොටස එක එක බුදුවරයෙකැ යි සලකන්නට නියම කළ හෙයින් දැනු දූ වැඩැ සිටිනාක් වැන්නහ. දිවමන් කල්හි දූ උන් වහන්සේ අප නොගළවන සේක. දුකින් මුදා සෙත්සිරි නො දෙන සේක. එහෙත් ඒ හැම අප විසින්ම ලබා ගන්නට මඟ වදාළ සේක. එහෙයින් අපගේ **'ශාස්තෘ'** නම් වන සේක. **"තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා"** (=නුඹලා විසින් ම වීර්යය වැඩියැ යුතු ය. බුදුවරයෝ හුදෙක් මඟ කියා දෙන්නෝ යැ) යි ද, **"යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මම 'ච්චයෙන සත්ථා"**(=ආනන්දය! ම විසින් නුඹලාට යම් ධර්මයක් විනයයක් දෙසන ලද නම් පනවන ලද නම් ඒ ධර්මවිනයය ම මගේ ඇවෑමෙන් නුඹලාගේ ශාස්තෘවරයා යැ) යි ද වදාළ බුද්ධවචනම ඊට සාධක වෙති.

උන් වහන්සේ **ඉටුදෙවියෙක්** වත්-හෙවත් දෙලොව ම හැම හොඳ නොහොඳ සලසන සර්වබලධාරී දෙවියෙකැ යි සිතා ගන්නා ලද මෙලොවදී නොපෙනී පරලොවදී ම පෙනෙන අමනුෂ්‍යයෙක්වත් හැම කල්හි ලොකාධිපත්‍යය උසුළමින් ලොව මුරකරන කවදා වත් නොමැරෙන **පාලකයාණ** කෙනෙක් වත් නො වෙති. එක කල්හි බුදුවරුන් දෙදෙනකුන් නො උපදිතත් බුදුබව එක් කෙනෙකුන් හට ම හිමි නොවූ **පොදු පදවියක්** වන බැවින් වුව මනා හැම පැරුම් පුරා නිමැවූ කහට වුවත් යම් කලෙකැ බුදු වියැ හැකිය . පිරිනිවියෙන් පසු බුදු නොබුදු කහට ත් නිර්වාණධාතුව එක සමාන වන බැවින් එහි උස් මිටි කම් නැත . **"එකා නිට්ඨා නො පුථු නිට්ඨා "** (=සංසාර මුක්තියෙන් වන නිෂ්ඨාව - හෙවත් - නිවන බුදු පසේබුදු මහරහත් කහටත් එක්බඳු ම ය. ඔවුනොවුනට වෙනස් වෙන වෙන නිෂ්ඨාවෝ නැත්තාහ) යි වදාළේ එහෙයිනි.

ඒ බුදුවරයෝ කිසි කලෙකත් තමන් නොදත් නුදුටුදැයක් අනුමානයෙන් පරිකල්ප වශයෙන් හෝ, අනුන්ගෙන් අසා ගත් (ආරංචි) පමණෙකින් අනුශ්‍රව වශයෙන් හෝ-නො වදාරා සියැසින් ම දුටු (=අත්දුටු) දෙය ම වදාළ බැවින් **'ප්‍රත්‍යක්ෂවාදීහු'** නම් වෙති. සියල්ල ම නිකම් අහෙතුක හාස්කම්වලින් නො වැ

සහෙතුක වැ ම වන බව වදාළ හෙයින් ‘හෙතුවාදීහු‘ නම් වෙති. එහිදු එක් ඵලයක් සේ පෙනෙන ධර්මකලාපයකට එක ම හෙතුවක් නො වැ නොයෙක් හෙතූන් ඇති බව දැක්වූ හෙයින් **‘නානාහෙතුවාදී‘**නමු දු වෙති. පරස්පරවිරොධී වූ - හෙවත් - පළමු කීවකට පසු වැ කීවක් විරුද්ධ වනසුලු වූ එකිනෙක නෙසැසැඳෙන එක බසකු ත් නොවදාළ බැවින් **‘අවයවාදී‘** නමුදු වෙති. සියලු නාමරූපධර්මයන් නොයෙක් ලෙසින් බෙදා වදාළ හෙයින් ද සියල්ලෙහි ගතැ යුතු කොටස ත් හළැ යුතු කොටස ත් වෙන් කොටැ බෙදා වදාළ හෙයින් ද **‘විභජ්‍යවාදී‘** නමුදු වෙති. මුළු ලොවැ නොයෙක් කල්හි පහළ වූ තාක් හැම වාදීන් පරදවා සත්‍ය වූ ත් ගැඹුරු වූ ත් න්‍යායානුකූල වූ ත් උසස් ධර්මයක් චතුර්විධ වෛශාරද්‍යයෙහි සිටැ වදාළ බැවින් **‘වාදිවර‘** නමු දු වෙති. හැම සත්වග අතුරෙන් ඉතා ම උසස් සත්ත්ව වූ මිනිස්වගෙහි ඉතා උසස් ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියෙන් ඉපිද ඒ ලත් මිනිසත්බව ගුණයෙන් හා නුවණින් දියුණු කොටැ ස්වඋත්සාහයෙන් පරමකොටියට - හෙවත් - එය ගෙනැ යතැ හැකි අන්තිම ඉහළ කොනට පමුණුවා ගැනී මෙන් ආශ්චර්යමනුෂ්‍ය වැ මිනිස් නොමිනිස් හැම සත්වගට අනුත්තර වූ (=තමනට වැඩි අනෙකක්හු නැත්තා වූ) සර්වලොකොත්තම පදය ලත් හෙයින් **‘ලොවුතුරා බුදුහු‘** නමු දු වෙති. උපතින් දෙවි නො වෙතත් විශුද්ධි දෙවත්වයෙන් **‘දෙවාතිදෙව‘** නමු දු වෙති. ඒ සම්මාසම්බුදුරජාණන් වහන්සේ නිවන් දක්නා තෙක් ම මාගේ ශාස්තෘහු-හෙවත්-අනුශාසකයන් වහන්සේ වෙත්වා !